UNIVERSITY OF COLOMBO, SRI LANKA
26 MAY 2005

# ඌව පළාත සඳහා අධ්‍යාපන සංවර්ධන සැලසුමක් සකස් කිරීමේ දී පැන නගින ගැටළු හා සැලකිය යුතු ප්‍රමුඛතා පිළිබඳ අධ්‍යයනයක්

UNIVERSITY OF COLOMBO, SRI LANKA
26 MAY 2005
LIBRARY

පී. ජී ආරියපාල
B. Sc. Public Administration (Special)
P. G. D. E.
MLIS (Malaysia)

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධි අවශ්‍යතාපූර්ණය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

University of Colombo
Library
Sri Lanka

2003

UCLIB
525876

## සාරාංශය

මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ ඌව පළාත සඳහා අධ්‍යාපන සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ දී පැන නගින ගැටළු හා සැලකිය යුතු ප්‍රමුඛතා මොනවාද යන්න අනාවරණය කර ගැනිම යි. විමධ්‍යගතකරණ ක්‍රියාවලිය අනුව පළාත් සභාව තුළ අධ්‍යාපන සැලසුම්කරණය සංවර්ධනය වී ඇති ආකාරය හා එහි ස්වභාවය, සැලසුම්කරණයේ මූලික ප්‍රබලතා හා දුබලතා පිළිබඳවත් අධ්‍යාපන සංවර්ධන සැලසුම් කියාත්මක වන ආකාරය පිළිබඳවත් පරීක්‍ෂා කිරීමට මෙහි දී අපේක්‍ෂා කෙරිනි. මේ සඳහා ප්‍රධාන වශයෙන් ලිඛිත ප්‍රශ්නාවලියක් භාවිත කර ඇත. එම තොරතුරුවල විශ්වසනීයතාව තහවුරු කර ගැනීමට සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගත් අතර තොරතුරු රැස් කිරීමට ලේඛන පරීක්‍ෂා කිරීම ද සිදු විය. ඌව පළාතේ අධ්‍යාපන සංවර්ධන කාර්යයට ඍජු ව ම සම්බන්ධ වේ යයි හැඟෙන නිලධාරීන් හා පළාත් සභා පාසල්වල විදුහල්පතිවරුන්ගෙන් තෝරා ගත් නියැදියකට ලිඛිත ප්‍රශ්නාවලි 120ක් බෙදා දෙන ලදුව එයින් සම්පූර්ණ කළ 56ක් විශ්ලේෂණය සඳහා ප්‍රයෝජනයට ගැනිණි.

අධ්‍යයනයට අනුව ඌව පළාත සඳහා අධ්‍යාපන සංවර්ධන සැලසුම් සකස් කෙරෙන බව අනාවරණය විය. එහෙත් පර්යේෂණයට සහභාගි වූ සියයට 53.6ක් ම එවැනි සැලැස්මක් ඇති බව නො දනී. එසේ සැලැස්මක් ඇති බව දන්නා නිලධාරීන් 26දෙනකු සිටි අතර එයින් 18දෙනකු පමණක් එය සකස් කිරීමට සහභාගි වී ඇත. දහතුන්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අධ්‍යාපන බලතල විමධ්‍යගතකරණය අනුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සැලසුම් සකස් කිරීමේ මූලික වගකීම දැරිය යුතු ය. මෙහි දි අනෙකුත් ආයතන, එනම් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප කාර්යාල, කොට්ඨාස කාර්යාල හා පාසල් වැනි ආයතන සම්බන්ධ කර ගත යුතු වුව ද එය ඵලදායි ලෙස ඉටු නො වේ. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා එම දෙපාර්තමේන්තුව වෙන වෙන ම සැලසුම් සකස් කරයි. පොදුවේ එක් සංවර්ධන සැලැස්මක් සකසනු දැකිය නො හැක. නිලධාරීන් සැලසුම් සකස් කිරීම සඳහා සහභාගි කර ගෙන ඇත්තේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව පමණි. මේ සඳහා කලාප මට්ටමේ සිට ඉහළට නිලධාරීන් සහභාගි කර ගනී. තම අදහස් සැලැස්මට ඇතුළත් වන බව ඔවුන්ගෙන් සියයට 47.1ක් පවසා ඇත. සංවර්ධන සැලසුම් සකස් කිරීමට සහභාගි

විය යුතු පාර්ශ්වයන් ප්‍රමාණවත් පරිදි නියෝජනය වෙතැයි කිව නො හැකි ය. පර්යේෂණයට සහභාගි වූ අයගෙන් වැඩිදෙනකු පවසන්නේ සැලසුම් සකස් කිරීමේ දි අඩු තරමින් විදුහල්පතිවරුන්ගේ මට්ටමේ සිට ඉහළටවත් එයට සහභාගි කර ගත යුතු බව යි.

ඌව පළාත සඳහා අධ්‍යාපන සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ දි පැන නගින ගැටළු රැසකි. පර්යේෂකයා විසින් දැනට ක්ෂේත්‍රය තුළ සාකච්ඡා කෙරෙන ගැටළු කිපයක් නම් කර ප්‍රමුඛතා අනු පිළිවෙලින් දැක්වීමට නිලධාරීන්ට නියම කරන ලදු ව මූල්‍ය සම්පත් හිඟ වීම, සුදුසුකම් ලත් නිලධාරීන්ගේ හිඟය, නිලධාරීන්ට ක්‍රමසම්පාදනය පිළිබඳ පුහුණුවක් නැති වීම, භෞතික සම්පත් ඌනතා, නූතන තාක්ෂණය භාවිතයේ ඇති අඩුපාඩු, පළාත් අධ්‍යාපන ප්‍රතිපත්ති ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති හා ගැටීම වැනි ගැටළු ඒ අනුව සඳහන් කර තිබිණි. මීට අමතර ව නිලධාරීන් තුළ ඇති අඩු කැපවීම හා ඔවුන්ගේ සෘණ ආකල්ප, අදාළ ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැති වීම, අදාළ අංශවලින් කලට වේලාවට යෝජනා නො ලැබීම, සකස් කරන සැලසුම් ක්‍රියාත්මක නො කිරීම, අධ්‍යාපන කළමනාකරණ පද්ධතියේ විධිමත් බව බිඳවැටීම, රජයයන් වෙනස් වන විට ප්‍රතිපත්ති වෙනස් වීම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන අය පිළිබඳ නොසලකා හැරීම හා සම්පත් බෙදාහැරීමේ විෂමතා සැලසුම්කරණ ක්ෂේත්‍රයේ ඇති ප්‍රධාන ගැටළු වශයෙන් ඔවුන් හඳුනාගෙන ඇත.

සැලසුම්කරණ ක්‍රියාවලිය තුළ දැකිය හැකි මූලික දුබලතා ලෙස සැලසුම් සකස් කිරීම සඳහා අදාළ පාර්ශ්වයන් ප්‍රමාණවත් පරිදි සහභාගි කර නො ගැනීම, සැලසුම්කරණ ක්‍රියාවලියෙහි පියවර ක්‍රමානුකූල ව අනුගමනය නො කිරීම, සැලසුම්කරණය සඳහා ප්‍රමාණවත් කාලයක් නො ලැබීම, පළාත් අධ්‍යාපන ප්‍රතිපත්ති හඳුනාගෙන නොමැති වීම, අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආයතන අතර සම්බන්ධීකරණය දුර්වල වීම හා සැලසුම සම්බන්ධව අදාළ නිලධාරීන් දැනුම්වත් නො වීම යන කරුණු හඳුනාගෙන ඇත. දැනට සැලසුම් සකස් කිරීමට සහභාගි වන අයගෙන් හරි අඩක් ම පවසන්නේ ඔවුනට තම කාර්යය සඳහා ප්‍රමාණවත් කාලයක් නො ලැබෙන බව යි. සැලසුම්කරණයට සෘජු ව සහභාගි වන නිලධාරීන් පළාත් අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කර ඇති බව දැක්වූව ද එවැනි ප්‍රතිපත්ති නිශ්චිත ව හඳුනාගත නො හැකි විය. මෙහි සැලසුම්කරණය සම්බන්ධයෙන් දැකිය හැකි ප්‍රධාන ම

දුබලතාව වන්නේ සකස් කරන සැලසුම් එලෙසින් ම ක්‍රියාත්මක නො වීම යි. මේ අනුව සැලසුම්කරණය හුදෙක් නෛතික අවශ්‍යතාව මත සිදු වන බව පෙනේ. එසේ සැලසුම් ක්‍රියාත්මක නො වීමට හේතුන් ලෙස මූල්‍ය සම්පත් හිඟය, ක්‍රියාත්මක කිරීමේ මට්ටමේ නිලධාරීන් තුළ සැලසුම පිළිබඳ ව අවබෝධයක් නොමැති වීම, සැලසුම් සකස් කරන හා ක්‍රියාත්මක කරන අය අතර සම්බන්ධයක් නොමැති වීම, ගුරු හිඟය, සැලසුමේ ඇති දුර්වලතා, නිලධාරී හිඟය හා සැලසුම දිගු කාලීන වීමෙන් වෙනස්කම්වලට හැඩගැසීමට අපහසු වීම වැනි කරුණු ප්‍රධාන තැනක් ගනී.

ඌව පළාත අනෙකුත් පළාත් හා සාපේක්ෂ වශයෙන් බලන විට පසුගාමී තත්ත්වයක් පෙන්නුම් කරන බැවින් මනා ක්‍රම සම්පාදනයක් අත්‍යවශ්‍ය බව බොහෝදෙනකුගේ අදහස යි. එහෙත් මෙම පර්යේෂණය අනුව පෙනී යන්නේ අධ්‍යාපන බලතල විමධ්‍යගත කිරීම යටතේ ඌව පළාත අධ්‍යාපන සැලසුම්කරණයෙන් උපරිම ඵල නො ලබන බව යි. ඌව පළාත අධ්‍යාපන සැලසුම්කරණයේ දී අවශ්‍යතා විශ්ලේෂණයක් කිරීමට හා ඒවා ප්‍රමුඛතාව අනුව සකස් කිරීමට උත්සාහ දරා ඇත. ප්‍රමුඛතාව ලබා දිය යුතු ක්ෂේත්‍ර ලෙස පිළිවෙලින් සම්පත් බෙදී යාමේ විෂමතාව අවම කිරීම, ගුරු හිඟය අවම කර ගැනීම, නූතන තාක්ෂණය හඳුන්වා දීම, භෞතික සම්පත් සපයා ගැනීම, ජාතික මට්ටමේ විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම, වෘත්තීය අධ්‍යාපනය හඳුන්වා දීම හා අධ්‍යාපනයේ නියමුවන් තුළ ධන ආකල්ප දියුණු කරවීම වැනි ක්ෂේත්‍ර හඳුනාගෙන ඇත.

ඌව පළාතේ අධ්‍යාපන සංවර්ධන සැලසුම්වල දැකිය හැකි ප්‍රබලතා ලෙස පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය තුළ වෙනම සැලසුම් ඒකකයක් පිහිටුවා තිබීම, පළාතේ ගැටළු හඳුනාගෙන තිබීම හා හොඳ දත්තපාදකයක් පවත්වාගෙන යාමට උත්සාහගෙන තිබීම පෙන්වා දිය හැක.